

# මෙවර අයවැයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සමානාත්මතාවය හා ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවලිය

1. දැනට පවත්නා සම්පත් බෙදීයාමේ විෂමතාවයන් අවම කර අධ්‍යාපනයේ සම සාධාරණත්ව අවස්ථා සහතික කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කිරීම.

2. පවත්නා වසංගත තත්ත්වයන් හමුවේ විකල්ප වශයෙන් හඳුන්වාදෙනු ලබන දුරස්ථ මාර්ගික/මාර්ගගත අධ්‍යාපන ක්‍රමවලට ප්‍රවේශ වීම සඳහා දිවයින පුරා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ආර්ථික අපහසුතා මත මෙම පහසුකම්වලට ප්‍රවේශ විය නොහැකි සිසුන් සඳහා නොමිලයේ ප්‍රවේශ වීමට හෝ සහන ගාස්තු ක්‍රම හඳුන්වාදීමට පියවර ගැනීම.

3. දීර්ග කාලසීමාවක් පාසල් වසා තිබීම මගින් පාසලේ දී දිවා ආහාරය නොලැබීම මත පෝෂණ තත්ත්වයන්ට ඇතිවන බලපෑම් අවම කිරීමට වැඩපිළිවෙළක් සැකසීමට ප්‍රතිපාදන වෙන්කිරීම.

4. දූරස්ථ අධ්‍යාපනය ලබාදීමේ ක්‍රියාවලිය ශිෂ්‍ය කේන්ද්‍රය වන පරිදි සිසුන් සමග අන්තර්ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා වූ නව තාක්ෂණික උපක්‍රම හා මෙවළම් උපරිම අන්දමින් භාවිත කළ හැකි පරිදි ගුරුවරුන්ගේ ධාරිතාවන් හා කුසලතාවන් ඉහළ නැංවීමට, යාවත්කාලීන කිරීමට අවශ්‍ය පුහුණු පැවැත්වීම, අධ්‍යාපනික ආධාරක නිර්මාණය කිරීම යනාදි වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

5. විශේෂ අවශ්‍යතා පවත්නා ළමුන්ට ඔවුන්ගේ අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම සඳහා අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

6. හදිසි අවස්ථාවන්හි ක්‍රියාවට නැංවිය හැකි විකල්ප අධ්‍යාපන ක්‍රම පිළිබඳව පර්යේෂණ සිදුකිරීම, වලංගුතාවය පරීක්ෂා කිරීම, ප්‍රමිතිගත කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා මානව හා භෞතික සම්පත්වලින් සමන්විත සංචිතයක් ස්ථාපිත කිරීම සඳහා සහ දැනට පවත්නා අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමට විශේෂ ප්‍රතිපාදන වෙන් කිරීම.

7. අනාගත අභියෝගවලට මුහුණදීමට වෙනස්වන තාක්ෂණය හා යාවත්කාලීන වීමට හා ජීවන කුසලතා අඛණ්ඩ ව වැඩිදියුණු කිරීම සඳහා වැඩිහිටියන් සඳහා වූ නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සම්පත් වෙන් කිරීම.

8. අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියේ දී අධ්‍යාපන ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශය හා අධ්‍යාපන නොවන අනෙකුත් අංශයන්හි නියෝජනත්වයෙන් යුත් විද්වත් කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.

9. රටේ අනාගත ආර්ථික සමාජයීය අවශ්‍යතාවලට ඵලදායීව දායකත්වය ලබාදිය හැකි ආකාරයට නව පරපුරේ දැනුම, කුසලතා ආකල්ප ගොඩනැංවීම සඳහා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

10. තිරසර සංවර්ධන අරමුණු අංක 04 සියලුදෙනා අන්තර්කරණය වූ සමානාත්වතාවයෙන් සහ ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපනයක් සහ අඛණ්ඩ ඉගෙනුම් අවස්ථාවන් තහවුරු කිරීම සඳහා සැලසුම් කිරීමේ මෙහෙය වීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම, සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

දැනුම කේන්ද්‍රීය වූ ආර්ථිකයක් තුළින් ශ්‍රී ලංකාවේ අනාගත සෞභාග්‍ය ඇති කර ගැනීම සඳහාත් සියලු ම ජනතාවට තමන්ගේ ශක්තියෙන් නැගී සිටිමින් ශ්‍රී ලාංකිකයකු වශයෙන් අභිමානවත්ව ස්වශක්තියෙන් ජීවත්වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාදීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහත සඳහන් කරුණු පිළිබඳව රජයේ අවධානය යොමුකර අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමු.

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය යනු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාකරනු ලබන දිවයින පුරා විහිදුනු සාමාජික සංවිධාන 57 කින් සමන්විත සිවිල් සංවිධාන එකමුතුවකී මෙම යෝජනා තම සාමාජික සංවිධාන සමග සිදුකරන ලද උපදේශන සාකච්ඡාවන්හි දී සාමූහික එකගතාවයකින් යුතුව සකස් කරන ලදී.**

CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

**COALITION FOR EDUCATIONAL DEVELOPMENT (CED)**
51/1, Silva Lane, Rajagiriya, Sri Lanka
Phone: +94 112 887642
Website: www.cedsrilanka.org

Coalition for Education Development (CED) is a consortium of organisations involved in the education sector at national provincial and local levels in Sri Lanka. Since its inception in 2004, CED has been involved in promoting civil society participation in formulating and implementing policies related to education in Sri Lanka. It is committed to steer the civil society participation as a vital part in the achievement of goals and targets of EFA, MDG and SDG declarations. Since SDG 4 goals provide the guideline for a new vision for education by 2030, CED has already addressed the issues of promoting civil society involvement in education development tasks of Sri Lanka. CED is a member organization of ASPBAE.